සන්නස
SANNASA



# මගේ ලෝකය

*There is only one happiness in this life, to love and be loved. ..*

ගුවන්විදුලි වැඩසටහනක් කරන මගේ සිතේ ඇති කරන්නේ වේදනාවකි.

3zzz ගුවන්විදුලි සේවය මෙල්බන් ප්‍රජා ගුවනිවිදුලි ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයකි. ඒ ඔස්සේ ගුවන්ගත වූ පළමු වැඩ සටහන සිංහල වැඩසටහන වීම අහම්බයකි. සැබැවින්ම ඒ ආරම්භක දිනයේ එවකට ආරම්භ කර තිබූ සෙරෙන්ඩිබ් නිව්ස් ඉංග්‍රීසි පුවත්පතේ සිංහල පිටුව බාරගෙන කරන්න යයි එහි සංස්කාරකවරුන් වූ ගීතිකා හා විරෝෂ් පෙරේරා මට ආරාධනා කළේ එදා 3zzz ගුවන්විදුලියේ දී ය. එතැනින් ආරම්භ වුණ මෙල්බන් සිංහල පත්තර කලාව කොයි තරම් දුරට ගියාදැයි නැවත ලියන්නට අදහස් නොකරමි. දන්නෝ දනිති.

Community radio is Australia's largest radio sector with 285 stations nationally. There are more community radio stations than commercial stations. (Source: McNair Ingenuity Community Radio Station Census 2013 and National Listener Survey)

Community radio thrives on the energy of our volunteer station workers and reflects the concerns of the communities we serve.

## ශනිදා සාදය පස්වන වසරට

# මෙල්බන් රේඩියෝවේ ආගිය කතා

"ඒ කාලෙ අපි රේඩියෝ එක ඉවර වෙලා එළියට බහිනකොටම කෝල් එකක් එනවා.. එක්කො ඩීබී (කුරුප්පු).. නැත්නම් එල්බී (ඒකනායක).. රේඩියෝ එකේ කතා කරද්දි අපි අතින් වැරදියට කියවුණ වචනයකට පවා අපට හොඳටම දෙහි කැපුවා" ඕස්ට්‍රේලියාවේ ගුවන් විදුලියකින් සිංහලෙන් කතා කළ පළමු නිවේදකයා - උපා උපදාස අතීතය අවදි කරමින් කියයි.

"අපි හැමදේම කළේ හරිම සැළසුම් සහගතව.. වැඩසටහන පටන්ගන්න පූර්විකාව ගැන පවා අපි හුඟක් සාකච්ඡා කරනවා.. වැදගත් යමක් කියන්න තමයි අපි හැමතිස්සෙම උත්සාහ කළේ" ස්වර්ණා උපදාස මහත්මිය කියයි. මෙල්බන් ගුවන් විදුලියේ පළමු කණ්ඩායමේ සිටි ඇයට කියන්නට බොහෝ මතක සටහන් ඇත.

"දවසක් වැඩසටහනක් ඉවර කරල එද්දි ඒකනායක අංකල් මට හොඳ කතාවක් කිව්වා.. පුතා ලස්සන වචන තියෙන්නෙ එහෙන් මෙහෙනේ දමල ගහන්න නෙවෙයි.. මුතු පොටක් වගේ ලස්සනට අමුණන්න.. එහෙම ඇමිණුවාම තමයි වචන වල ලස්සන පේන්නෙ.. ඇත්තටම ඒ ප්‍රවීණයන් නිසා අපි කොයි තරම් දේ ඉගෙන ගත්තද?" මාධ්‍යය නිසි ලෙස හඳුණාගනිමින් ගුවන්විදුලියට එක් වූ ප්‍රසන්න කුරුකුලරත්න ඒ යුගයේ ගුවන් විදුලිය වටා එක් වී සිටි ප්‍රවීණයන් කෙරෙහි වූ කෘතවේදීත්වය පළ කරයි.



ප්‍රසන්න කුරුකුලරත්න

බන්දු දිසානායක, සෑම් වීරරත්න, ෂයාමන් ජයසිංහ, රෝහණ කරුණාරත්න, අනෝජා කරුණාරත්න වැනි ප්‍රවීණයන්ට මෙල්බන් ගුවන්විදුලියේ අතීතය ගැන කියන්නට බොහෝ දේ තිබුණි. පසු කලෙක ගුවන් විදුලියට එක් වූ අසෝක සිල්වා, නෙළුම් අමුණුගම, නුවන් සමරපති, වරුණ සාවින්ද, ගාමිණී රණසිංහ, සෙව්වන්දි අබේරත්න, කරුණාරත්න අමරසිංහ වැනි ගුවන්විදුලි ශිල්පීන් ශිල්පිනියන් වරින් වර සිය මතකය අවදි කරන්නේ සඟවාගත් කණගාටුවක්ද සමගින් ය. ඒ සියළු කතාබහ අවසන් වූයේ එක් තැනකිනි.

"රේඩියෝ එක අහපු කාලයක් මතක නැහැ"

ඒ ප්‍රකාශය අතීතයේ 3zzz ගුවන්විදුලිය හා එක්ව සිටි අය අතරින් අඳත් එහි



ආගිය කතාවකට එක්වූ අය - ජයශ්‍රී චන්ද්‍රජිත්, ජගත් ජේ එදිරිසිංහ, නුවන් සමරපති, ගාමිණී රණසිංහ, කැමරන් කොළඹගේ, වරුණ සාවින්ද, ශ්‍යාමන් ජයසිංහ, අසෝක සිල්වා, අමරසිංහ අමුණුගම, රෝහණ කරුණාරත්න, අනෝජා කරුණාරත්න ස්වර්ණා උපදාස, උපා උපදාස, සෑම් වීරරත්න, බන්දු දිසානායක, රණසිංහ, නෙලුම් අමුනුගම, නිරුපමා සල්මලී

සිංහල වැඩ සටහන තිබුණේ දෙවන වැඩ සටහන ලෙස ය. පළමු වැඩ සටහන කළ අයගේ නොදැණුවත්කම නිසා ඔවුන් මැදිරියේ සිට ඉදිරිපත් කළ ද ඒ වැඩ සටහන ගුවන්ගත වුණේ නැත. ශ්‍රාවකයන්ට අසන්නට ලැබුණ පළමු වැඩසටහන වූයේ දෙවෙනි වැඩසටහන වූ සිංහල වැඩ සටහනයි. එය ඉදිරිපත් කළ නිවේදකයා උපා උපදාස යි.

පළමු දා සිටම ගුවන්විදුලිය සමග අසන්නෝ රොද බැඳගත් හ. එය අපේ ප්‍රජා සන්නිවේදනයේ වැදගත් ස්ථානයක් හෙබ වූ අතර දැඩි කැපවීමෙන් වැඩසටහන් ඉදිරිපත් කළ නිවේදක නිවේදිකාවන් සේම නිෂ්පාදකයන් නිසා වැඩ සටහනේ ගුණාත්මකභාවයද ඉතා ඉහළ මට්ටමක විය. එල් බී ඒකනායක ඩීබී කුරුප්පු වැනි වියත්තු ඒ වටා රැඳෙමින් අවවාද අනුශාසනා දුන්හ. ප්‍රමිතිය රැකගත්හ. එල්බී ඒකනායක ලියූ "සිංගරුපාය" වැනි උසස් ගුවන්විදුලි නාට්‍ය පවා ගුවන්ගතවුණේ ඉතා අඩු පහසුකම් යටතේ ය. ඒ අතීතය රසවත්ය. ඒ ගැන කතා කරන්නට බොහෝ රසමුසු තැන් අපමණ ය.

1999 දී හෝ 2000 දී පමණ මගේ පළමු ගුවන්විදුලි සාකච්ඡාව නිෂ්පාදනය කළේ රෝහණ කරුණාරත්න ය. නිවේදකයා වූයේ ආනන්ද බාලසූරිය ය. පටිගතකිරීමේ ඩිජිටල් තාක්ෂණය නොතිබුණ එදා විශාල ස්පූල් දෙකක් සහිත පටිගතකිරීමේ යන්ත්‍රයකින් රෝහණ ඒ සාකච්ඡාව පටිගත කළ හැටි මට තවම මතක ය. මගේ දෙවන සාකච්ඡාව මෙල්බන් මාධ්‍ය ක්ෂේත්‍රයට ඉතා වැදගත් වූ සාකච්ඡාවක් වූයේ යයි අද මට සිතෙයි.

ඒ දෙවන සාකච්ඡාව කළේ උපා උපදාස යි. මගේ "කන්ද උඩ මාළිගාව" කෙටිකතා පොත සම්බන්ධයෙනි. එදා ඒ ප්‍රවීණ නිවේදකයා මුළු පොතම කියවා වැදගත් තැන් සටහන් කරගෙන පැමිණ සිටි අතර ඒ සාකච්ඡාව ඉතා අර්ථාන්විත එකක් විය.

"සීඩී දෙක තුනක් අරගෙන ඇවිත් මොනවා හෝ කියවා යන රේඩියෝ එකක් නෙවෙයි අපි එදා කළේ.. හැම දේටම ඉතා හොඳින් සූදානම් වුණා.. සතියක් පුරා පොත පත කියවලා කරුණු හොයාගෙන තමයි අපි මැදිරියට ආවෙ.. එයා ටයිම් එකේ තියෙන වටිනාකම අපි හොඳට දැනගෙන හිටියා.. ඒ එක්කම මේ මාධ්‍යය ගැන අපි හොඳට අධ්‍යයනය කළා.. ඉගෙනගන්නෙ නැතුව කොහොමද මාධ්‍යයක් කරන්නෙ?"

මගේ මතකය නිවැරදි නම් 2000 දී හෝ 2001 දී පමණ දිනෙක රෝහණ කරුණාරත්න මට දුරකතන ඇමතුමක් දුන්නේ ය.

"අපි අලුත් රේඩියෝ ටීම් එකක් හදනවා.. ඔයාගෙ නමත් යෝජනා වෙලා තියෙනවා.. එන්න අපි එක්ක මේ වැඩේට" ඔහු ආරාධනා කළේ ය.

"මම ආරාධනා කළාට ජගත් එකපාරටම බැහැයි කිව්වා" රෝහණ අද ඒ මතකය අවදි කරයි.

සැබෑවකි. මෙල්බන් සමාජසේවා වැඩ වලට බසින්නට මගේ කැමැත්තක් නොවීය. මට අවශ්‍ය වූයේ මගේ හුදෙකලාවේ නිමග්න වී මගේ නිර්මාණ කටයුතුවල යෙදෙන්නට ය. එහෙත් රෝහණ සිය උත්සාහය අත්නොහැරීමේ අවසන් ප්‍රතිඵලය වූයේ අපි අලුත් කණ්ඩායමක් ලෙස ගුවන්විදුලිය බාරගැනීම ය. අසෝක සිල්වා අපේ කැඳවුම්කරු විය. ඒ කණ්ඩායමෙන් මම තවමත් 3zzz ගුවන්විදුලිය හා සම්බන්ධව සෙනසුරාදා උදේ 7ට ශනිදා සාදයෙන් ශ්‍රී ලාංකික ප්‍රජාව අමතමින් සිටින්නෙමි. සෙනසුරාදා උදේ 7ට ශනිදා සාදය මගේ සිතැඟියාව අනුව ස්වාධීනව කරගෙන යන්නට මට අවසර දීම පිළිබඳව සිංහල කමිටුවට මගේ ස්තූතිය හිමිවිය යුතුය.

ප්‍රවීණ නිවේදිකා තේජා කටුගම්පොළත් මමත් දැන් වසර හතරක් තිස්සේ ශනිදා සාදය ගෙන ඒමේ දුෂ්කර ව්‍යායාමය විඳ ගනිමින් සිටින්නෙමු. උදෑසන 7ට නැගිට ගුවන්විදුලියට සවන්දෙන ශ්‍රාවක ප්‍රජාවක් ගොඩනැගීමේ අභියෝගය ජයගැනීම සඳහා අපට සහය වන අපේ කණ්ඩායම අපය ශක්තියකි.

ශනිදා සාදය මේ මාසයේදී වසර හතරක ගමනක් සම්පූර්ණ කර පස්වන වසරට පිය තැබුවේ ය. ජනප්‍රිය ගුවන්විදුලි වැඩසටහනක් මෙල්බන් ප්‍රජාවට බෙදා දෙන්නට හැකිවීමේ සතුට මේ මොහොතේ අපි විඳ ගනිමින් සිටින්නෙමු.

මේ කුඩා සටහන ලිව්වේ ඒ සතුට වෙනුවෙන් ය.



ජගත් ජේ එදිරිසිංහ